**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2024**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු III ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. (i) අයදුම්පත් භාර ගැනීම - මෙම *ගැසට් නිවේදනයේ* අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අනුව 'ඒ 4' ප්‍රමාණයේ (සෙ.මී. 21x29) කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අපේක්ෂකයා විසින් අයදුම්පත් සකස් කර ගත යුතුය.

(ii) අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 3.0 තෙක් පළමුවන පිටුවටද, 4.0 සිට 6.0 තෙක් දෙවන පිටුවටද, ඉතිරිය තුන්වන පිටුවටද වන ලෙස පරිගණකය භාවිතයෙන් පිළියෙල කර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත්කළ යුතුය.

(iii) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.

(iv) අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද ආදර්ශ අයදුම්පත්‍රය පිළියෙල කිරීමේදී අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(v) අපේක්ෂකයා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ම සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024.11.30 වැනි දින** හෝ ඊට පෙර ලැබෙන සේ " වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, 230, බෞද්ධාලෝක මාවත, කොළඹ -07'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(vi) අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී විභාග ගාස්තු වශයෙන් රු. 600/- ක මුදලක් ගෙවීම අනිවාර්ය වේ. එය ලංකා බැංකුව, රෝහල පාර, කොළඹ 01, තැප්‍රොබේන් ශාඛාවේ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ නමින් පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 7042385 දරණ ගිණුමට බැරවන පරිදි ගෙවා රිසිට් පත අයදුම්පත්‍රයේ අලවා එවිය යුතුය.

(vii) අයදුම්පත් එවීමේ දී ''ගබඩා භාරකරු තනතුර සඳහා බඳවා ගැනීම -2024'' යනුවෙන් අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ සඳහන් කළ යුතුය.

(viii) රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් නියමිත දිනට පෙර එවිය යුතුය.

(ix) අයදුම්පත් ලැබුනු බව දන්වනු නොලැබේ. අයදුම්පත් හෝ ඊට සම්බන්ධ වෙනත් ලියවිල්ලක්, තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

(x) අදාළ ආකෘතියට අනුකූල නොවන, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. අනන්‍යතාවය - විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;

හෝ

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය ;

හෝ

(iii) වලංගු රියදුරු බලපත්‍රය.

4. සාවද්‍ය තොරතුරු - අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. කිසියම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත්ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත.

5. අපේක්ෂකයකු විසින් ඉදිරිපත්කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක දී අසත්‍ය බව අනාවරණය වුවහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කරනු ඇත.

6. (i) මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා (MN 01-2016) වැටුප් කාණ්ඩය අනුව
රු. 27,140-300 x 10-350 x 11-495 x 10-660 x 10- රු. 45,540/- ක් වන අතර වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන අනුවය.

(ii) තනතුරට පත්වීමෙන් පසු හතරවන වැටුප් පියවර එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

7. (i) වයස් සීමාව - අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
(ii) රාජ්‍ය සේවයේ නියුතු නිලධාරියෙකු නම් අයදුම්පත්‍රය ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

8. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි-
   (i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම්කරුවන් වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වන අතර ඉදිරියේදී මේ සම්බන්ධයෙන් රජය විසින් ගනු ලබන තීරණයන්ට ඔබ යටත්විය යුතුය.

   (ii) මෙම පත්කිරීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.එසේම 2022.12.14 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද අංක 2310/29 දරන කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

   (iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාවයන් නියමිත කාලය තුල ලබාගත යුතුය.

   (iv) සාමාන්‍ය කාර්යාලයීය ගබඩා භාණ්ඩ හා දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් වැඩබිම් හා ව්‍යාපෘතීන්ට අදාල යන්ත්‍රෝපකරණ, ඉංජිනේරුමය ද්‍රව්‍ය භාරයේ තබා ගැනීම විධිමත් පරිදි නිකුත් කිරීම තනතුරට අදාල රාජකාරි වේ.

   (v) රාජ්‍ය සේවකයකු වශයෙන් ඔබ දිවයිනේ ඕනෑම ස්ථානයක සේවයේ යෙදීමට බැඳී සිටියි.

9. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :
   (i) අධ්‍යාපන සුදුසුකම් :
      (අ) සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වී තිබීම ;

      සහ

      (ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් සමත්ව තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර).

   (ii) කායික සුදුසුකම් :
   ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

   (iii) වෙනත් :
      (අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය;
      (ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය;
      (ඇ) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේනම් පමණි.
      (ඈ) ඉහත 9(i)(අ)(ආ) සුදුසුකම්වලට අමතරව පරිවාස කාලය තුළ දී ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය මඟින් පවත්වන ගබඩාකරණය පිළිබඳ මාස තුනක (03) පුහුණුව සාර්ථකව හදාරා තිබීම තනතුරේ ස්ථිර කිරීමට අවශ්‍ය සුදුසුකමක් වේ.

10. අයදුම්කරුවන් විසින් මෙහි පහත දැක්වෙන ලියකියවිලි වල මුල් පිටපත් අවශ්‍ය අවස්ථාවක දී ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කර තබාගත යුතුය.
   (i) උප්පැන්න සහතිකය
   (ii) අධ්‍යාපන සහතික
   (iii) අවශ්‍යතාවය දැනුම් දීමෙන් පසුව මාස 06 ඇතුළත දී ලබා ගත් චරිත සහතික දෙකක්

11. පත්වීම සඳහා තෝරාගනු ලබන අන්දම - මෙම බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පමණක් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකි. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය සමත් අයදුම්කරුවන් අතුරින් ඉහලම ලකුණු ලබාගත් අනුපිළිවෙලට තෝරාගනු ලැබේ. (මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සියල්ලම සපුරා තිබීම අනිවාර්ය වේ)

මෙම විභාගය **2024 වර්ෂයේ දී කොළඹ දී** පමණක් පත්වනු ලැබේ.

12. තෝරා ගැනීමේ ක්‍රමය :-

ලිඛිත විභාගය :

| *ප්‍රශ්න පත්‍රය* | *ලකුණු* | *සමත් වීමේ අවම ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 | පැය 1 |

(*බුද්ධි පරීක්ෂණය* - අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නාවලියකින් යුක්තය.)

13. (i) *විභාගයට පෙනී සිටීම* - විභාගය පැවැත්වෙන දිනට සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශපත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කල යුතුය.

(ii) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් www.irrigation.gov.lk වෙබ් අඩවියේ Downloads - Exam යටතේ නිවේදනයක් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, ඒ බව වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම්, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද සමග විමසීම වඩාත් ඵලදායී වනු ඇත.

14. විභාග අයදුම්කරුවන්ගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු හෝ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ රාජ්‍ය සේවයේ මාණ්ඩලික තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

15. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන සියලුම නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් ඔහු/ඇය ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

16. මෙම විභාගය පැවැත්වීම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේය.

*සටහන* - මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ වී ඇති නිවේදන අතර, යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්විය යුතු බව කරුණාවෙන් සලකන්න.

ඉංජි. අජිත් ගුණසේකර,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2024 ඔක්තෝබර් මස 04 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
කොළඹ 07.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි).

ආදර්ශ අයදුම්පත්‍රය

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ**
**විවෘත තරඟ විභාගය - 2024**

THE OPEN COMPETITIVE EXAMINATION FOR THE RECRUITMENT TO THE POST OF STORE KEEPER (GRADE III) IN THE IRRIGATION DEPARTMENT -2024

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1
දෙමළ - 2

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :————————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :————————————.
(සිංහලෙන් / දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————.
(සිංහලෙන් / දෙමළෙන්)

1.5 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

1.6 ස්ත්‍රී/පුරුෂ භාවය :
(අදාළ අංකය කොටුව තුල ලියන්න) ස්ත්‍රී 1
පුරුෂ 2

2.0 2.1 ස්ථිර ලිපිනය :————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————————.
(සිංහලෙන් / දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :
(i) සිංහලෙන් / දෙමළෙන් :————————.
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————————.

2.4 දුරකථන අංකය : පෞද්ගලික ————————.

3.0 3.1 විවාහක / අවිවාහක බව :

විවාහක -2 අවිවාහක -1

3.2 උපන් දිනය :

අදාල කොටුව තුළ ලියන්න.

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :————.

අවු. | | | මාස | | | දින | | |

3.4 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියකු වන්නේ උපතින් ද ? ලියාපදිංචි වීමෙන් ද ?
:——————————————————.

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය :
1. විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය :————. මාසය :————.
11. විභාග අංකය :————.

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස.(උ/පෙළ) විභාගය :
1. විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය :————. මාසය :————.
11. විභාග අංකය :————.

| *විෂය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

4.3 අමතර අධ්‍යාපන සුදුසුකම් :................. .........................................................
.....................................................................
.....................................................................
.....................................................................

5.0 මුදල් ගෙවූ ලදුපත / කුවිතාන්සිය මෙහි අලවන්න.

| |
|---|
| |

6.0 ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේ ද?
(අදාල කොටුවේ (✓ ) ලකුණ යොදන්න)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

එසේ දඬුවම් ලැබ ඇත්නම්, ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන තොරතුරු සපයන්න. ...... ................................ ................................ ........................
...... ................................ ................................ ................................

7.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳ දරා ගැනීමට මම එකඟ වෙමි.තවද මෙහි සියලුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) විභාගය පැවත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත්, මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයක් පිළිගැනීමට මම එකඟ වෙමි.

(ඇ) මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට පෙර නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු වුවද සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් මම දනිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...... ........................... මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ...... ........................... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ
(දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණක් අදාළ වේ.)
..........................................................මයා/මිය/මෙනවිය, .................................
සේවයේ නියුතු ...... ........................... තනතුර දරන නිලධාරියෙකු බවත්, ඔහු/ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත්, ...... ........................... සේවයෙන් ඔහු/ඇය මුදාහැරිය හැකි/නොහැකි බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව.

දිනය :————.

11-33